# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, දෙවන වසර (මාර්ගගත) - 2021

## ගිවිසුම් නීතිය
(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **06**

ප්‍රශ්න තුනකට **(03) පමණක්** පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

01. (අ) ඔෂානා ඇයට නිවසක් ඉදිකර ගැනීම සඳහා "ග්‍රීන් විෂන්" ඉදිකිරීමේ සමාගම සමඟ ගිවිසුමකට ඇතුලත් විය. පාර්ශවයන් අතර වූ එකඟතාවයට අනුව වරුණ් නැමති දක්ෂ නිර්මාණකරුවෙක් ග්‍රීන් විෂන් විසින් කුලියට ගැනීමටත් අභ්‍යාන්තර නිර්මාණය ඔෂානාගේ සිතැඟි පරිදි වෙනම සිදු කිරීමටත් නියමිත විය. ඔෂානා ස්පාඤ්ඤ ආකෘතියෙහි නිර්මාණයක් ඉල්ලා සිටියාය. වරුණ් වෙත අමුද්‍රව්‍ය සඳහා රුපියල් 1,000,000 සහ ඔහුගේ සේවය වෙනුවෙන් රුපියල් 300,000 ක් ගෙවීමට ග්‍රීන් විෂන් එකඟ විය. කෙසේ නමුත් Covid-19 වසංගත කාලය තුලදී පනවන ලද ආනයන සීමා හේතුවෙන් අමුද්‍රව්‍ය වල මිල ඉහල ගොස් තිබුණි. අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ අමතර වියදම් පියවා ගැනීමට වරුණ්ට ඔහුගේ මුදල් වියදම් කිරීමට සිදු විය. මේ අතරතුර කාලයේදී ඔෂානා ඇගේ අදහස වෙනස් කළ අතර ස්පාඤ්ඤ ගෘහ නිර්මාණයක් වෙනුවට ඉතාලි ගෘහ නිර්මාණයක් අවශ්‍ය විය. එහි ප්‍රතිඵලයක් ලෙස වරුණ්ට ඉතාලි නිර්මාණයන් ඉගෙන ගැනීමට සිදුවූ බැවින් වැඩ ආරම්භ කිරීම ප්‍රමාද විය. ග්‍රීන් විෂන් මේ පිළිබඳව දැනගෙන සිටි අතර කිසිදු විරෝධතාවයක් නොදැක්වීය. අමුද්‍රව්‍ය සඳහා අමතර රුපියල් 200,000 ක් සහ ඔහුගේ සේවය වෙනුවෙන් අමතරව රුපියල් 150,000 ක් වරුණ් ඉල්ලා සිටියි.

ප්‍රතිඥාව පිළිබඳ නීතිය අදාල කරමින් පහත සඳහන් දෑ සාකච්ඡා කරන්න.

i. අමතර ගෙවීමක් ලැබීම සඳහා වරුණ්ට හිමිකමක් පවතීද?

ii. අමතර ගෙවීමක් ලැබීම සඳහා වන ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප වුවහොත් ග්‍රීන් විෂන් සහ ඔෂානාට විරුද්ධව පොරොන්දු ප්‍රතිබන්ධනය පිළිබඳ සිද්ධාන්තය වරුණ්ට යොදා ගත හැකිද?

(ලකුණු ප්‍රමාණය 2 X 30 = 60%)

(ආ) ඇල්ෆඩ් නිෂ්පාදන ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා සමාගමක් සංස්ථාගත කිරීමට බලාපොරොත්තු විය. ඇල්ෆ්‍රඩ් තම මිතුරියක වූ නීතීඥ ඔෂානා වෙත ගොස් සමාගම සංස්ථාගත කිරීම සඳහා නීතිමය සහාය පැතීය. ඔෂානා අවශ්‍ය සියල්ල සිදුකළ අතර පසුව සමාගම සංස්ථාපනය කරන ලදී. පසුව ව්‍යාපාරය හොඳින් පැවති කාලය තුළ ඇල්ෆඩ්, ඔෂානාට පොරොන්දු වූයේ සමාගම සංස්ථාපනය කිරීම සඳහා සපයන ලද නීතිඥ සේවය වෙනුවෙන් රුපියල් 200,000 ක් ගෙවන බවය. කෙසේ නමුත් Covid-19 හේතුවෙන් ව්‍යාපාරයේ තත්ත්වය සතුටුදායක නොවූ අතර පොරොන්දුව වී මාස කිහිපයකට පසු ඇල්ෆඩ් සමාගමේ කොටස් වලින් භාගයක් ගිසේලාට විකුණුවේය. ඇල්ෆඩ් එකඟවී තිබූ ගෙවීම ඔෂානා ඉල්ලා සිටි විටදී ඔවුන් අතර වලංගු ගිවිසුමක් නොමැතිබව පවසමින් ඔහු ගෙවීම ප්‍රතික්ෂේප කළේය.

i. ඇල්ෆඩ්ට විරුද්ධව ඔෂානාට වලංගු ඉල්ලීමක් කළ හැකිදැයි සොයා ගැනීමට ඔෂානා ඔබගේ උපදෙස් පතයි. ඔෂානාට උපදෙස් දෙන්න.

ii. ඉහත සඳහන් කරන ලද ගිසේලාට විකුණන ලද භාගයක කොටස් වලට අමතරව ඇල්ෆඩ් තමාගේ කොටස් වලින් 5% ක් ගිසේලාට පවරා, ඔෂානා වෙත ගෙවීම කරන ලෙස ඉල්ලා සිටී නම්, ගිසේලාට විරුද්ධව ඔෂානා වෙත වලංගු ඉල්ලීමක් පවතින්නේ දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු ප්‍රමාණය 40%)

02. ගොඩනැගිලි ඉදිකිරීමේ හා ගොඩනැගිලි ද්‍රව්‍ය ව්‍යාපාරයක රමල් යෙදී සිටියේය. යාල නගර සභාවේ (YMC) ක්‍රීඩා සහ ශාරීරික අභ්‍යාස පුහුණු ශාලාවක් ඉදිකීම සඳහා ලංසු තැබීමට ආරාධනා කරන වෙළඳ දැන්වීමක් ඔහු දුටු අතර රුපියල් මිලියන 250 ක මුදලකට ලංසු තැබීය. වෙළඳ දැන්වීමට අනුව අඩුම ලංසුව තෝරාගන්නා අතර 2021 නොවැම්බර් වන විට ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යුතුය. වෙළඳපලෙහි සිමෙන්ති හිඟයක් ඇතිවේ යැයි අපේක්ෂා කළ බැවින් සිමෙන්ති මලු 5000 ක් එක් රැස්කර තබා ගැනීමට රමල්ට අවශ්‍ය විය. ඔහුගේ සුපුරුදු සැපයුම්කරුවන සිරිල්ගෙන් සිමෙන්ති සපයා ගැනීම සඳහා හොඳම මිලක් විද්‍යුත් ලිපියක් හරහා ඔහු විමසුවේය. 2021 අගෝස්තු 22 වන දින රමල් වෙත විද්‍යුත් ලිපියක් හරහා සිරිල් දන්වා සිටියේ "කිලෝ 50 ක බෑගයක් රුපියල් 1450 ක් වනු ඇත" බවය. එදිනම රමල් සිරිල් වෙත කෙටි පණිවිඩයක් හරහා තමන් සිමෙන්ති මලු 5000 ක් එකක් රුපියල් 1400 බැගින් මිලදී ගැනීමට කැමති බවත් ඔවුන්ගේ දීර්ගකාලීන ව්‍යාපාර සම්බන්ධතාවය සලකා බලමින්

සිරිල් ඒ සඳහා එකඟවේ යැයි බලාපොරොත්තු බවත් දැන්වූ නමුත් රමල්හට තමාගේ කෙටි පණිවිඩයට පිළිතුරක් නොලැබිණි. ඒවනවිටත් වෙළඳපළෙහි සිමෙන්ති හිඟයක් පවතින බව අවබෝධ කර ගනිමින් ඊට පසුදින රමල් රුපියල් 1450 බැගින් සිමෙන්ති මිලදී ගැනිමට තීරණය කර තමාගේ සමාගමේ ආකෘතියක මිලදී ගැනීමේ ඇණවුමක් යැවීය. රමල්ගේ සේවයකුගේ නොසැලක්ලිමත්බව හේතුවෙන් මිලදී ගැනීමේ ඇණවුමෙහි අවශ්‍ය ප්‍රමාණය සඳහන් නොකර තිබුණි. මිල, මුදල් ගෙවීමේ ක්‍රම සහ ප්‍රමාණය මලු 4000 යනාදි ලෙස සැපයුමෙහි විස්තර ඇතුලත්ව 2021 අගෝස්තු 24 වන දින සිරිල් රමල් වෙත විකුණුම් සටහනක් යැව්වේය. 2021 සැප්තැම්බර් 01 දින ඔහුගේ ලංසුව තෝරා නොගත් බව YMC විසින් රමල් වෙත දැන්වීය. රුපියල් මිලියන 252 කට තබන ලද ෆයිසාල්ගේ ලංසුව තෝරාගෙන ඇතිබව ඔහු පසුව දැන ගත්තේය.

ගිවිසුම් සංස්ථාපනය ආශ්‍රිත නීතිය කෙරෙහි අවධානය යොමු කරමින් රමල් වෙත උපදෙස් දෙන්න. නඩු තීන්දු නීතිය යොදාගනිමින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු ප්‍රමාණය 100)

03. (අ) බිලූ සොලුයුෂන් සීමිත සමාගම (BSL) පොහොර නිෂ්පාදනය කිරීමේ ප්‍රධාන සමාගමකි. එය 2019 දී සාර්ථක ලෙස නව පොහොරක් හඳුන්වා දුනි. 2010 සිට BSL හි නිත්‍ය පාරිභෝගිකයෙක් වූ මයිකල් නව පොහොර කිලෝ 500 ක් මිලදී ගත් අතර ඔහුගේ ඉඩමෙහි ඒවා භාවිතා කරන ලදි. නව පොහොර වර්ගය ඔහුගේ ඉඩමෙහි පසට නුසුදුසු වීම හේතුවෙන් මයිකල්ගේ භෝග අසාර්ථක විය. පසුව ඔහු පස පරීක්ෂා කළ අතර නව පොහොර යෙදීමෙන් පසෙහි තෙතමනය සැහෙන දුරට අඩුවී ඇති බැවින් එහි ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය ආකාරයට නොව නිතරම භෝග සඳහා ජලය යෙදිය යුතුව තිබූ බවත් ඉඩම ඊලඟ වගාව සඳහා සූදානම් වන්නේ මාස හයකට පසුව බවත් එහිදී දැනගනු ලැබීය. BSL වෙතින් විඳීමට සිදුවූ පාඩුව පූර්ණය කරගැනීමට වූ මයිකල්ගේ ඉල්ලිමෙහි සියලු වගකීම්, භාවිතයට පෙර පස පරීක්ෂා කළ යුතු බවත්, නිෂ්පාදනය නිසා සිදුවන කිසිදු අලාභයක්, වගකීමක් හෝ හානියක් සඳහා සමාගම වග නොකියන බවට වන වැදගත් දැන්වීමක් සෑම පොහොර බෑගයකම අඩංගුවන බව පවසමින් ප්‍රතිෂේප විය. ඉංග්‍රීසි ඇතුළු භාෂා කිහිපයක කුඩා අකුරු වලින් බෑගයෙහි පිටු පස දැන්වීම මුද්‍රණය කර ඇති බව මයිකල් සොයාගනී. මයිකල් තර්ක කරනු ලැබූයේ පෙරදී BSL පොහොර භාවිතයේදී කිසිදු විටක පස පරීක්ෂා නොකළ බවයි.

සුදුසු අධිකාරින් උපුටා දක්වමින් මයිකල්ට උපදෙස් දෙන්න.

(ලකුණු ප්‍රමාණය 60%)

(ආ) සමාන කොටස් හතරක් යටතේ මුද්‍රිත ප්ලාස්ටික් බෑග් මිලියනයක් ජේම්ස් වෙතින් මිලදී ගැනීමට BSL ගිවිසුමකට ඇතුලත් වූයේය. කිලෝ 50 ක පොහොර දැරීම සඳහා බෑගය ශක්තිමත් විය යුතු බව BSL, ජේම්ස් වෙත දැන්විය. 'සෑම භාරදීමක් අවසානයේදී ඉක්මනින් ගෙවීම් සිදු කළයුතු බවත් එසේ කිරීමට අසමත් වුවහොත් එම වගන්තිය අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි ගිවිසුම අවසන් කිරීමට විකුණුම්කරුට හැකි බව' සඳහන් වගන්තියක් විකිණීමේ ගිවිසුමෙහි විය. භාරදීමෙහි පළමු කොටස සිදුකළ නමුත් කිලෝ 50ක පොහොර පිරවීමෙන් පසු බෑග් ඉරුණු බැවින් ඔවුන්ගේ අරමුණ ඉටු නොවන බව පවසමින් BSL ගෙවීම ප්‍රතික්ෂේප කළේය. BSL ගිවිසුම අවසන් කිරීමට බලාපොරොත්තු වන අතර ජේම්ස්ගෙන් ගෙවන ලද අත්තිකාරම් මුදල සහ වන්දි ඉල්ලා සිටියි. ජේම්ස් තර්ක කරනුයේ BSL ගිවිසුම කඩ කළ බවය.

සුදුසු අධිකාරින් උපුටා දක්වමින් කරුණු සාකච්ඡා කරන්න.

(ලකුණු ප්‍රමාණය 40%)

04. ගිවිසුම් බල රහිත කිරීමේ සාධකවලට (vitiating factors)අදාල නීතිය යොදා ගනිමින් පහත සඳහන් කරුණු සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුරට හේතු දැක්වීම මෙන්ම විනිශ්චිත නඩු තීන්දු හා සංකල්ප ඇසුරින් බලපෑමට ලක්වූ පාර්ශ්වයන්ට පවතින ප්‍රතිකර්ම මොනවාද යන්න කෙරෙහි අවධානය යොමු කිරීම ද ඔබෙන් අපේක්ෂිතය.

(අ) 2019 පෙබරවාරි මාසයේදී කැමිලා ලොතරැයියක් ජයග්‍රහණය කළාය. ස්වයංක්‍රීය සේදීමේ ව්‍යාපාරයක් වන ක්ලීන් ඩ්‍රයිව් හි හිමිකරු වන විනීත් ෆේස්බුක් හරහා කැමිලා සමඟ මිතුරු විය. ඇය ලොතරැයියක් ජයග්‍රහණය කළ බව විනීත් දැනගෙන ඔහුගේ ව්‍යාපාරයේ මුදල් ආයෝජනය කර ඔහුගේ ව්‍යාපාරයේ හවුල්කාරිත්වයක් ගන්නා ලෙස අර්පණය කළේය. ආයෝජනය සිදුකර මාස තුනක් ඇතුලත ඔහු ආයෝජන මුදල දෙගුණ කරන බවට පොරොන්දු විය. පසුගිය මාස තුනක කාලය තුළදී උපයන ලද ලාභවල වාර්තා විනීත්, ඇයට පෙන්විය. කැමිලා මුදල් ආයෝජනය කළාය. විනීත් පොරොන්දු වූ ආකාරයට ව්‍යාපාරය දියුණු වීමක් හෝ මුදල් දෙගුණවීමක් සිදු නොවිය. විනීත්ගේ පෙර හවුල්කරු විනීත්ව හැරගොස් සමාන ව්‍යාපාරයක් අසලින් ආරම්භ කර ඇති බවත් විනීත් එය කැමිලාට අනාවරණය නොකර ඇති බවත් කැමිලා පසුව දැන ගත්තාය.
කැමිලාට උපදෙස් දෙන්න.

(ලකුණු ප්‍රමාණය 40%)

(ආ) කෝෂල්ට ඉඩම් කොටස් දෙකක් හිමි අතර එකක් බඩ ඉරිඟු වගාව සඳහා සුදුසු අතර අනෙක වී වගාව සඳහා සුදුසු විය. ඔහු ඉඩම්වලින් එකක් වසර හතරක් සඳහා රවීන් වෙත බද්දට දීමට අර්පණය කළේය. රවීන් ගෙවීම් ක්‍රම පිළිබඳව විමසූ අතර එය මාසිකව රුපියල් 31,250/- ක් සහ රුපියල් 1,500,000/- ක් බවට ඔහුට දැනුම්දෙනු ලැබීය. මාසිකව කුලිය ලෙස රුපියල් 31,250/- ක් පමණක් ගෙවිය යුතු අතර රුපියල් 1,500,000/- වනුයේ වසර හතර සඳහා ගෙවිය යුතු මුදල යැයි උපකල්පනය කරමින් රවීන් අර්පණය ප්‍රතිග්‍රහණය කළේය. ඇත්තවශයෙන්ම ආපසු නොගෙවන ආකාරයේ අත්තිකාරම් මුදලක් ලෙස රුපියල් 1,500,000/- ක මුදල කෝෂල්ට අවශ්‍ය වූ අතර රවීන් ඉඩමට ඇතුලුවීමට පෙර ඔහු එය ඉල්ලා සිටියේය. අත්තිකාරම ගෙවීම ප්‍රතික්ෂේප කරමින් රවීන් තර්ක කළේ ගිවිසුමට ඇතුලු වීමට පෙර තමා ඒ පිළිබඳව දැනුවත් නොවූ බවය.

i. රවීන් සහ කෝෂල් අතර ගිවිසුමේ වලංගුතාවය සාකච්ඡා කරන්න.
ii. රවීන් බද්දට ගැනීමට ගිවිසගත් ඉඩම වෙනත් අයෙකුට දැනටමත් බදු දී ඇති වී වගාව සඳහා වන ඉඩම නම් සහ බඩ ඉරිඟු වගා කිරීමට සුදුසු ඉඩම බද්දට ගැනීමට රවීන් අදහස් නොකළේ නම් ඇතිවන තත්වය කෙබඳු ද?

(ලකුණු ප්‍රමාණය 60% = 30 X 2 = 60%)

05. (අ) රාමාට අයත් සාප්පු සංකීර්ණයෙහි රෙදිපිළි සාප්පුවක් පසුගිය වසර තුනක කාලයෙහි පෙරේරා මහතා සහ මහත්මිය බද්දට ගෙන තිබුණි. නිරන්තර රැකවරණයක් අවශ්‍ය සුවකළ නොහැකි බවට රෝග විනිශ්චය කර ඇති රෝගයකින් පෙළෙන පෙරේරා මහතාගේ හා මහත්මියගේ පුතා වන නිනෝ කෙරෙහි ඔවුන් දැඩි සැල්කිල්ලක් දක්වයි. හිඟ බදු මුදල් ගෙවීමට නියමිත නිසා ඔවුන්ට බද්ද අලුත් කිරීමට අවශ්‍ය වන්නේදැයි ඉතා ඉක්මනින් ඔහුට දැනුම්දෙන ලෙස රාමා ඔවුන්ට ප්‍රකාශ කරයි. නිනෝගේ රෝගී තත්ත්වය හා අවශ්‍යතා දනිමින්, රාමා වැඩිදුරටත් පවසන්නේ තමන් නව අවුරුදු පහක බද්ද ලබා දෙන්නේ සැලකිය යුතු ඉහළ කුලියකට පමණක් බවයි.පෙරේරා මහතා සහ මහත්මියට ඔවුන්ගේ පුත්‍රයා රැකබලා ගැනීම සඳහා විශ්‍රාම ගැනීමට අවශ්‍ය වුවත් රෙදිපිළි සාප්පුවේ ආදායම නොලැබීයාම ඔවුන්ට දැරිය නොහැකි වේ. මේ නිසා ඔවුහු බදු ගිවිසුම අකමැත්තෙන් අත්සන් කරති.

පෙරේරා මහතා සහ මහත්මියට ගිවිසුමෙන් ඉවත්වීමට අවශ්‍යවේ. ඔවුන්ට උපදෙස් දෙන්න.

(ලකුණු ප්‍රමාණය 40%)

(ආ) සරත් ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ කිරි නිෂ්පාදන සමාගමක හිමිකරු වන අතර ඔහුගේ ව්‍යාපාරයට ගොවිපළෙහි නිවසක්, කර්මාන්තශාලාවක් සහ සතුන් ඇතුළත් වේ. ඔහු සතුන්ට ඇලුම් කළ අතර ඔහුගේ ගොවිපළේ දුර්ලභ සතුන් විශේෂ කිහිපයක්ද සිටියේය. පුද්ගලික හේතු මත තමා සතු වත්කම් විකිණීමට ඔහු තීරණය කළ අතර සුදුසු ගැනුම්කරුවෙක් වන මිහිර හමුවිය. මිලියන දෙසීයක වටිනාකමකට සංගෘහිතව වූ එකඟතාවය මිහිර සහ සරත් අත්සන් කළ අතර, ගොවිපළෙහි නිවස, කර්මාන්තශාලාව සහ සතුන් විකිණීම සඳහා වෙනම කොටස් තුනක් එහි අඩංගු විය. පසුව මිහිරට අවබෝධ වූයේ සත්ත්ව හා ශාඛ ආරක්ෂා කිරීමේ ආඥා පනතෙහි තහනම් කර ඇති සමහර සතුන් ද ගොවිපළෙහි ඇතුළත් වන බවත් ඒ අනුව 'ආරක්ෂිත සතුන් හා සම්බන්ධ ඕනෑම වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙනයාම හෝ පවත්වාගෙන යාම' තහනම් බවය. මිහිරට අවශ්‍යවූයේ ගොවිපොළ නිවසෙහි පදිංචි වී කිරි නිශ්පාදනය සඳහා සතුන් වෙනත් ස්ථානවලින් මිලදී ගෙන නිශ්පාදනය ආරම්භ කිරීමටය. ගොවිපළෙහි නිවස විකිණීම සිදුකළහොත් ඔහුගේ සතුන් අභිජනනය කිරීම සඳහා ස්ථානයක් නොමැති බව දක්වමින් ඒ සඳහා අවස්ථාව ලබා දීම සරත් ප්‍රතික්ෂේප කළේය.

සුදුසු අධිකාරින් උපුටා දක්වමින් නෛතික ප්‍රතිඵල පිළිබඳව සාකච්ඡා කරන්න.

(ලකුණු ප්‍රමාණය 60%)

06. චාමර සහ හාතිය ලංකා ක්‍රිකට් සමාජය (CCC) වෙනුවෙන් ක්‍රීඩා කරති. ඔවුන් CCC සමඟ අත්සන් කළ ගිවිසුමෙහි අනෙකුත් කරුණු අතර පහත වගන්ති ඇතුලත් වේ:

- ක්‍රීඩා සමාජය ක්‍රීඩකයාගෙන් අපේක්ෂා කරන පරිදි සියලුම තරඟවල ක්‍රීඩා කිරීමට ක්‍රීඩකයා එකඟ වේ.
- ක්‍රීඩා සමාජය අපේක්ෂා කරන පුහුණු සැසි සඳහා සහභාගී වීමට ක්‍රීඩකයා එකඟ වේ.
- ක්‍රීඩකයාට වසරකට රුපියල් මිලියනක් ගෙවීමට ක්‍රීඩා සමාජය එකඟ වේ.
- ගිවිසගත් කාලය තුළ වෙනත් ක්‍රීඩා සමාජයන් වෙත ක්‍රීඩා කිරීම ක්‍රීඩකයාට තහනම් වේ.
- යම් අවස්ථාවකදී ක්‍රීඩකයා ගිවිසුමෙහි සඳහන් ඕනෑම වගන්තියක් කඩ කළ අවස්ථාවකදී, දඩුවමක් ලෙස නොව ප්‍රමාණ කළ වන්දි ලෙස රුපියල් මිලියන පහක් ක්‍රීඩා සමාජයට අයකර ගත හැකිය.

'සමස්ත ලංකා ක්‍රිකට් තරඟාවලියේදී' හාතිය සම්පූර්ණ තරඟ පහටම සහභාගී වූ නමුත් සැලසුම්කර තිබූ පුහුණු සැසි සියල්ලම ඔහුට මගහැරුණි. වෙළඳ දැන්වීමක ඡායාරූප ගතකිරීමකට සහභාගී වීමට අවශ්‍ය වූ නිසා තරඟාවලියෙහි තරඟ දෙකක් චාමරට මගහැරුණි. CCC තරඟාවලියෙහි සියලුම තරඟ පරාජයට පත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ක්‍රීඩකයන් ගේ අදක්ෂ බව සහ කැපවීමක් නොමැතිවීම හේතුවෙන් CCC ඔවුන් ගේ කීර්තිනාමය අහිමිකරගෙන ඇතැයි සඳහන් කරමින් CCC හි අනුග්‍රාහකයන්, අනුග්‍රහක එකඟතාවයන් දීර්ග කිරීම ප්‍රතික්ෂේප කළහ. CCC බංකොලොත්වීමට ආසන්නබව අවබෝධවීමෙන්

පසු චාමර ප්‍රතිවාදී ක්‍රීඩා සමාජයක් වන වෙස්ටන් ක්‍රිකට් (Western Cricket) සමඟ සම්බන්ධ වීමට ගිවිසුමක් අත්සන් කළේය. පුහුණු සැසි සඳහා සහභාගී නොවීම හේතුවෙන් ඔහුගේ ගිවිසුම අවසන්කළ බව CCC භාතිය වෙත ලිඛිතව දැනුම් දුන්නේය.

ගිවිසුම කඩ කිරීම සඳහා සහ ඔවුන්ගේ අනුග්‍රහක ගිවිසුම් අහිමි වීම සඳහා වන්දි ලබා ගැනීම සඳහා චාමරට එරෙහිව නඩු පැවරීමට CCC බලාපොරොත්තු වේ. ගිවිසුමක වගන්ති, ගිවිසුම කඩකිරීම, වන්දි ආශ්‍රිත නිතිය කෙරෙහි විශේෂයෙන් අවධානය යොමුකරමින් CCC සහ භාතිය වෙත උපදෙස් දෙන්න.

(ලකුණු ප්‍රමාණය 100)

(සෑම ප්‍රශ්නයක්ම 100 න් ලකුණු කරනු ලැබේ.)

*********